# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ


**අංක 1919/33 - 2015 ජුනි මස 16 වැනි අඟහරුවාදා - 2015.06.16**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනත**

2 වැනි වගන්තිය යටතේ නියමය

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් අමාත්‍ය රවී කරුණානායක වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වෙළඳ භාණ්ඩ සම්බන්ධයෙන් ඒ උපලේඛනයේ II වැනි තීරයේ අනුරූප සටහන්වල නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණ මත විශේෂ වෙළඳ භාණ්ඩ බද්දක්, මෙම නියමය මගින් පනවමි. මෙම නියමය 2015 ජුනි මස 17 වැනි දින සිට ආරම්භ වන මාස 06 ක කාල සීමාවක් සඳහා, 2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වගන්තියේ (3) වැනි උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, වලංගුව පැවතිය යුතු ය.

2007 අංක 48 දරන විශේෂ වෙළඳ භාණ්ඩ බදු පනතේ 2 වැනි වගන්තිය යටතේ පනවන ලද 2015.04.01 දිනැති අංක 1908/29 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් එළවලු තෙල් (සංයෝජිත වර්ගීකරණ ශීර්ෂ අංක 15.07, 15.11, 15.12, 15.13) සඳහා ප්‍රකාශිත අදාල නියමයන් සහ 2015 පෙබරවාරි මස 24 වැනි දිනැති අංක 1903/4 දරන අති විශෙෂ ගැසට් පත්‍රය මගින් පියලි කළ රතු පරිප්පු (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0713.40.12) සහ පියළි කළ කහ පරිප්පු (සංයෝජිත වර්ගීකරණ සංකේත අංක 0713.40.22) සඳහා ප්‍රකාශිත අදල නියමයන් 2015 ජුනි මස 17 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි අවලංගු කරමි.

රවී කරුණානායක,<br>
මුදල් අමාත්‍ය.

2015 ජුනි මස 15 වැනි දින,<br>
කොළඹ 01,<br>
මුදල් අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

| *I වැනි තීරය* | | | | *II වැනි තීරය* |
|---|---|---|---|---|
| *වෙළඳ භාණ්ඩය* | | | | *විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද* |
| | *සං. ව. ශීර්ෂය* | *සං. ව. සංකේතය* | *විස්තරය* | |
| 1. | 07.13 | 0713.40.12<br>0713.40.22 | පියලි කළ - මයිසූර් පරිප්පු (රතු පරිප්පු)<br>පියලි කළ - කහ පරිප්පු | කි. ග්‍රෑමයට ශත 0.25<br>කි. ග්‍රෑමයට ශත 0.25 |
| 2. | 15.07 | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, සෝයා බෝංචි තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |


1A - PG 2515 — 506 (2015/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය (සම්බන්ධිතයි)

| I වැනි තීරය | | | | II වැනි තීරය |
|---|---|---|---|---|
| වෙළඳ භාණ්ඩය | | | | විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද |
| | සං. ව. ශීර්ෂය | සං. ව. සංකේතය | විස්තරය | |
| | 15.07 | 1507.10 | මැලියම් ඉවත් කළ හෝ නොකළ අශුද්ධ තෙල් | කි. ග්‍රෑමයට රු. 105.00 |
| | | 1507.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, පාම් තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | 1511.10 | ශුද්ධ නොකළ තෙල් | කි. ග්‍රෑමයට රු. 105.00 |
| | 15.11 | 1511.90 | අනෙකුත් | |
| | | 1511.90.10 | කාමර උෂ්ණත්වයේ ඇති අනුක්‍රමික කොටස් (පාම් ස්ටියරින්) | කි. ග්‍රෑමයට රු. 105.00 |
| | | 1511.90.20 | ලීටර් 210 හෝ ඊට අඩු ප්‍රමාණයන්ගෙන් අසුරා ආනයනය කරනු ලබන පාම් තෙල් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | 1511.90.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, සූර්යකාන්ත ඇටවල තෙල්, සප්ෆ්ලවර් හෝ කපු ඇට තෙල් සහ ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | 15.12 | | සූර්යකාන්ත ඇටවල තෙල් හෝ සප්ෆ්ලවර් තෙල් හා ඒවායේ ඉතිරි වූ කොටස් | |
| | | 1512.11 | ශුද්ධ නොකළ තෙල් | කි. ග්‍රෑමයට රු. 105.00 |
| | | 1512.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | 15.13 | | ශුද්ධ කළ හෝ නොකළ නමුත් රසායනිකව නවීකරණය නොකළ, පොල් (කොප්පරා) පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් | |
| | | | පොල් (කොප්පරා) තෙල් හා ඉන් ඉතිරි වූ කොටස් | |
| | | 1513.11 | අශුද්ධ තෙල් | |
| | | | තොග වශයෙන් | |
| | | 1513.11.11 | අදූෂිත පොල් තෙල් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | 1513.11.19 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | | අනෙකුත් | |
| | | 1513.11.21 | අදූෂිත පොල් තෙල් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | 1513.11.29 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | 1513.19 | අනෙකුත් | |
| | | 1513.19.10 | තොග වශයෙන් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | 1513.19.90 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | | පාම් ගෙඩි මද හෝ බාබසු තෙල් හා ඒවායින් ඉතිරි වූ කොටස් | |
| | | 1513.21 | අශුද්ධ තෙල් | කි. ග්‍රෑමයට රු. 110.00 |
| | | 1513.29 | අනෙකුත් | කි. ග්‍රෑමයට රු. 125.00 |

07 - 89

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.